# තැම්පාන රක්ෂිතය ආශ්‍රිත බම්බා ලෙන් විහාරයේ ඇති කලාකෘති පිළිබඳ අධ්‍යයනයක්

පී.වී.ඒ. මධුශානි

මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ayeshamadushani205@gmail.com

ප්‍රමුඛ පද: ලෙන් විහාරය, මහනුවර සම්ප්‍රදාය, ප්‍රතිමා කලාව, සිතුවම්, කලාත්මක වටිනාකම

## හැඳින්වීම

ස්වභාව සෞන්දර්යයෙන් පූර්ණ වූ මනරම් භූමියක පිහිටා ඇති බම්බා විහාරය ඓතිහාසික, ජෛව විවිධත්ව මෙන්ම කලාත්මක අගයෙන්ද විශේෂත්වයක් උසුලයි. පැරණි පිහිටීම අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් වූ වැඋඩපිල්ල හත්පත්තුවේ තිරිගන්දාහේ, නැගෙනහිර කෝරලේ මානෙල් ඔළුව ගමේ මෙම ස්ථානය පිහිටයි. නූතන පිහිටීමට අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉඳුල්ගොඩ ග්‍රාමසේවා වසමේ කුරුණෑගල නගර සභාවට අයත්ව තැම්පාන ජලාශයට යාබදව තැම්පාන රක්ෂිතය තුළ මෙමවිහාරය ස්ථාපිත වී තිබේ. එම නිසාම මෙම ලෙන් විහාරය වටා වූ අපූර්ව කලාත්මක වටිනාකමක් ගෙන තිබේ. කුරුණෑගල නගරයේ සිට කි. මී. අටක් නුවර මාර්ගයේ ගමන් කොට පීලිකඩ මංසන්දියෙන් හැරී ඉඳුල්ගොඩකන්ද මාර්ගයේ කි. මී. පමණ ගිය තැන මෙම ස්ථානය හමු වේ.

තැම්පාන රක්ෂිතය හා ජලාශයට අයත්ව පිහිටීම නිසා මෙය අදටත් සශ්‍රික භූමි භාගයක් ලෙස උසස් භූගෝලීය වටිනාකකමක් උරුමකර ගෙන තිබේ. දේශගුණික වශයෙන් ගත් කළ තෙත් කලාපයට අයත් වන අතර මෙම ලෙන් විහාරය ලෙන් තුනකින් සමන්විත වීමද විශේෂ වේ. තැම්පාන රක්ෂිතයේ සිට මීටර 200 ක් පමණ ඊසාන දෙසින් පිහිටා ඇති මෙම බම්බා ලෙන් විහාරය වැවේ මට්ටමට වඩා මීටර 10ක් උසින් පිහිටයි. මෙම ලෙන් විහාරය නමින් ද හඳුන්වනු ලබන අතර එම විහාරයට පිවිසීමට අලංකාරවත් පිවිසුම් මාර්ගයක්ද දැකිය හැකිය.

ජනප්‍රවාදයන්ට අනුව මෙම ස්ථානය වලගම්බා රජතුමා සැඟව සිටි ස්ථානයක් වශයෙන් සැලකේ. පසුකාලීනව එම ස්ථානයේ ඔහු විසින් විහාරයක් කරවා ඇති අතර එය බම්බා විහාරය ලෙස හඳුන්වනු ලැබේ. ඒ අනුව මෙහි ඉතිහාසය අනුරාධපුර යුගයේ ආරම්භ ව මහනුවර යුගයේදී අලුත්වැඩියා කටයුතු සිදු කිරීම නිසා වර්තමානයේ එම යුගය ආශ්‍රිත ලක්ෂණ ප්‍රකට කරයි. මෙම විහාර භූමියේ පොකුණක් දැකගත හැකි අතර එය වලගම්බා රජතුමා සහ බිසව ස්නානය කළ ස්ථානය ලෙස ජනප්‍රවාදයේ එයි. මෙයද මහනුවර යුගයේදී නැවත ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර තිබීම නිසා එම ලක්ෂණ පෙන්නුම් කරයි. එමෙන්ම මෙම ලෙන් ආශ්‍රිතව කටාර සහිත ගල්ලෙන් කිහිපයක්ද දැකිය හැකි අතර ඒ තුළින් මෙම ස්ථාන ආශ්‍රිතව භික්ෂූන් වහන්සේලා වැඩ සිටින්නට ඇතැයි විශ්වාස කළ හැකිය.

ලංකාව තුළ ලෙන් ආශ්‍රිත කලාත්මක අගයන් දැකගත හැකි ස්ථාන විශාල ප්‍රමාණයක් තිබේ. ඒ අතරින් මෙම බම්බා ලෙන් විහාරයටද සුවිශේෂ ස්ථානයක් හිමි වන්නේ එහි පවත්නා කලාත්මක වටිනාකම නිසාවෙනි. මෙම ලෙන් විහාරය ආශ්‍රිතව පැරණි සිතුවම් දැකිය හැකි අතර ඒවා මහනුවර යුගයට අයත් යැයි සැලකේ. මෙහි ආරම්භය අනුරාධපුර යුගයට අයත් වන නිසා මෙහි එම යුගයේ සිතුවම් තිබෙන්නට ඇතැයි විශ්වාස කල හැකි වුවද ඊට සාක්ෂි දැක ගත නොහැකි වේ. මහනුවර යුගයේදී ලෙන් විහාරය නැවත ප්‍රතිසංස්කරණ වලට ලක් වීම නිසා එම සිතුවම් ද මහනුවර සිතුවම් ලක්ෂණ ගනී. එලෙස අඳින ලද සිතුවම් ඉදිරිපස බිත්තියෙත්, දෙපස බිත්ති දෙකකත් සහ ලෙන් පියස්සෙහිත් දැකගත හැකිය. සිතුවම් වලට අමතරව මහනුවර යුගයට අයත් යැයි සැලකෙන බුද්ධ ප්‍රතිමා කිහිපයක්ම දැක ගත හැකිය. අවස්ථා කිහිපයකදී නිදන් හොරුන්ගේ ග්‍රහණයට ලක්වීම නිසා ප්‍රතිමා විවිධ පළුදුවීම්වලට ලක් වී තිබෙනු දැක ගත හැකිය. මෙම සිතුවම් මෙන්ම ප්‍රතිමා කලාවද මෙහි ඓතිහාසික වටිනාකම ඉස්මතු කරන්නක් වශයෙන්ද දැක්විය හැකිය. ලංකාවේ පැරණි සිතුවම් හා ප්‍රතිමා දැක ගත හැකි ඓතිහාසික ස්ථානයක් වශයෙන් තැම්පාන බම්බා විහාරය සතු අගය වටහා ගැනීමත්, එහි කලාත්මක අගය වටහා ගැනීමත් මෙහි දී අරමුණු කොට ගන්නා ලදි. මේ පිලිබඳ පර්යේෂණ සිදු කර තිබුණද ඒ සඳහා සුවිශේෂී වාර්තාවක් සකස් වී නොමැති නිසා එම අරමුණ ඇතිව මෙම අධ්‍යයනය සිදු කිරීමට බලාපොරොත්තු වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා දත්ත හා තොරතුරු රැස් කිරීමේදී මූලාශ්‍රය අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යනයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. මෙහිදී ක්ෂේත්‍ර අධ්‍යයනය ප්‍රධාන වූ අතර අධ්‍යයන ප්‍රදේශයට ගොස් දත්ත එක්රැස් කිරීම්, ඡායාරූපගත කිරීමත්, සැලසුම් ඇඳීමත් සහ සම්මුඛ සාකච්ඡාත් සිදු කරන ලදී. මෙහිදී මෙම ස්ථානය පිලිබඳ ලියවුණු මූලාශ්‍රයන් පිලිබඳවත් වැඩි අවධානයක් යොමු කරන ලදි. මෙම ලෙන් විහාරය ලෙන් කොටස් තුනකින් සමන්විත වන අතර මෙම අධ්‍යයනය තුළ සීමාව වශයෙන් ඉන් එක් ලෙන් විහාරයක් තෝරා ගැනීමට සිදු විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ ඉපැරණි සිතුවම්, ප්‍රතිමා මෙන්ම ඓතිහාසික වටිනාකමක් ඇති ලෙන් විහාරයක් ලෙස තැම්පාන ආශ්‍රිත බම්බා ලෙන් විහාරය හඳුනාගත හැකි ය. මෙම විහාර භූමිය ආශ්‍රිත සිතුවම් කොටස් මෙන්ම ප්‍රතිමා කලාව මහනුවර යුගයට අයත් යැයි සැලකෙන අතර ඒ තුළින් එම යුගයේ ලක්ෂණ ප්‍රකට වන ආකාරය හඳුනාගත හැකිය. මෙම ලෙන් විහාර භූමියේ කලාත්මක අගය වැඩි වීම සඳහා තැම්පාන රක්ෂිතයද විශේෂත්වයක් උසුලයි. කුරුණෑගල නගර සභාව සහ වනජීවී දෙපාර්තමේන්තුව හරහා පාලනය වන මෙම ලෙන් විහාරයද සුරක්ෂිතව තිබෙනු දැකිය හැකිය.

මෙහි සිතුවම් විවිධ වස්තු විෂයන් පාදක කර ගෙන ඇඳ තිබේ. ඒ අතර මහින්දාගමනය, ජය ශ්‍රී මහා බෝධිය වැඩමවීම, යනාදී සිතුවම් මෙහි දෘශ්‍යමාන වේ. එහි ලෙන් පියස්සෙහි අලංකාරවත් මල් මෝස්තරයක් දැකගත හැකිය. මෙහි වර්ණ භාවිතය ද මහනුවර යුගයට නෑකම් කියයි.මෙහි ලෙන් පියස්සේ චිත්‍ර හැර අනෙක් සිතුවම් අවස්ථා කිහිපයකදී ම ප්‍රතිසංස්කරණයට ලක්කර තිබේ. මෙහි ඉදිරිපස බිත්තියේ චිත්‍ර කොටසක් සැතපෙන ප්‍රතිමාවට වැසී තිබේ.

මෙම ලෙන් විහාරයේ දැකිය හැකි තවත් සුවිශේෂ කලා අංගයක් ලෙස එහි දැකගත හැකි ප්‍රතිමා සම්ප්‍රදාය හඳුන්වාදිය

හැකිය. මෙහි ඇති විශාල සැතපෙන පිළිමය පිරිනිවන් ඉරියව්ව විදහා දැක්වෙන ප්‍රතිමාවක් වේ. මීට අමතර ව සමාන අංග ලක්ෂණවලින් සමන්විත හිඳිපිළිම තුනක් ද එක් හිටි පිළිමයක් ද දැකිය හැකිය. මෙහි අභය මුද්‍රාව දැකිය හැකිය. මීට අමතරව විෂ්ණු දේව ප්‍රතිමාවක්ද මුගලන් හිමියන් මූර්තිමත් කර දැක්වීමද දැකිය හැකිය. මෙම ප්‍රතිමාවන්ද මහනුවර යුගයටඅයත් වේ.

බම්බා විහාරය තුළ අදටත් ශේෂව පවත්නා සිතුවම් මෙන්ම ප්‍රතිමා මෙම විහාරයේ වටිනාකම වැඩිවීමට හේතු වී තිබේ. මෙම හේතු සාධක මත උසස් කලාත්මක අගයකින් සුවිශේෂී වුණු ලෙන් විහාරයක් වශයෙන් තැම්පාන බම්බා ලෙන් විහාරය හඳුන්වා දිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

සෝමතිලක, එම්. (2004)***පුරාතන ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව.*** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මහින්ද, උණුවතුර බුබුලේ. (2013)***ලක්දිව බෞද්ධ කලා ඉතිහාසය.*** කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

හේරත්, චමින්ද. (2004)කෙටි නිබන්දන.ශ්‍රී ලංකා කැළණිය විශ්වවිද්‍යාලය.